# කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව
## දූරස්ථ සහ අඛණ්ඩ අධ්‍යාපන කේන්ද්‍රය
### ශාස්ත්‍රවේදී (සාමාන්‍ය) උපාධි තෙවන පරීක්ෂණය (බාහිර) - 2014/15
### 2019 පෙබරවාරි - අප්‍රේල්
### සමාජීයවිද්‍යා පීඨය

## දර්ශනය
## සාමාන්‍ය මනෝවිද්‍යාව PHIL - E 3015

ප්‍රශ්න හතරකට (04) පිළිතුරු සපයන්න.

ප්‍රශ්න සංඛ්‍යාව : 08 යි. කාලය : පැය 03 යි.

---

01. "මනෝවිද්‍යාව වූ කලී මිනිස් චර්යාව සහ මනස අධ්‍යයනය කිරීමේ විෂය ක්ෂේත්‍රයයි" මනෝවිද්‍යාවේ නිර්වචන හා විෂය ක්ෂේත්‍රය ඇසුරෙන් පැහැදිලි කරන්න.

02. මනෝවිද්‍යා විෂය සංවර්ධනය කිරීමෙහිලා මනෝවිද්‍යා ගුරුකුලයන්ගේ කාර්යභාරය විස්තර කරන්න.

03. චර්යාවාදී ඉගෙනුම් න්‍යායක් වන සම්භාව්‍ය ආරෝපණ න්‍යායෙන් පෙන්වා දෙන ඉගෙනුම පිළිබඳ සංකල්ප උදාහරණ සහිතව පැහැදිලි කරන්න.

04. ඔබ දන්නා පෞරුෂ න්‍යායයන් දෙකක් පදනම් කරගනිමින් පෞරුෂයේ සැකැස්ම හා පෞරුෂ සංවර්ධනය සිදුවන ආකාරය විමර්ශනය කරන්න.

05. "අභිප්‍රේරණය" පිළිබඳ මාස්ලෝගේ අවශ්‍යතා න්‍යාය ඇසුරින් පුද්ගලයා ආත්ම සාක්ෂාත්කරණය කරා ගමන් කරන ආකාරය පැහැදිලි කරන්න.

06. "සංජානනය යනු ඉන්ද්‍රිය මඟින් ලබාගන්නා සංවේදන තෝරා ගැනීමේ, සංවිධානය කිරීමේ හා අර්ථකථනය කිරීමේ ක්‍රියාවලියයි". සංජානනය සම්බන්ධ ගෙස්ටෝල්ට් මූලධර්ම නිදසුන් සහිතව විභාග කරන්න.

07. ගැටලු නිරාකරණය, මානසික චින්තනය මත රඳාපවතින්නක් වන අතර ඒ සඳහා පුද්ගල පෞරුෂය බලපෑමක් ඇතිකරවන ආකාරය විශ්ලේෂණය කරන්න.

08. "ස්මෘති ක්‍රියාවලියේ විශේෂ ලක්ෂණය ධාරණයයි". ධාරණය දියුණු කිරීමට උපකාරීවන මනෝවිද්‍යාත්මක ක්‍රමවේද පිළිබඳ සාකච්ඡා කරන්න.

*******************************